# බටහිර සංගීතය

## හාර්මනි (harmony)

බටහිර සංගීතයේ ඇති තවත් සංගීත ශිල්ප ක්‍රමයකි. ස්වරයක් සමග තවත් ස්වරයක් හෝ ස්වර කිහිපයක් එක්වර නාදවත් වීමේදී ඇතිවන ධ්වනි සුසංයෝගී ගුණය harmony නමින් හැඳින්වේ.

යම්කිසි නාද මාලාවක් සමඟ තවත් නාද මාලාවක් හෝ නාදමාලා කීපයක් එක්ඟත්වයකින් යුතුව නාදවත් වීම මෙහි දී සිදු වේ.

harmony සිද්ධාන්තය අනුව 3rd harmony , 4th harmony, 5th harmony ආදි වශයෙන් ස්වර ස්වර සුසංයෝග වේ.

මේ අනුව බලන විට කෝඩ්ස්(chords) සහ හාර්මනි (harmony) අතර විශාල වෙනසක් නොමැත.

කෝඩ්ස් මගින් කිසියම් නාද මාලාවක් ගායනයේදී හෝ වාදනයේදී ගායනයට හෝ වාදනයට සහයක් ලබා දෙන අතර harmony මගින් කිසියම් නාද මාලාවක තුළ ඇති ගැඹුරු බවක් හා පුළුල් බවක් පෙන්නුම් කරයි

බටහිර ශාස්ත්‍රීය සංගීතයේදී සහ ව්‍යවහාරික සංගීතයේදී මෙම harmony සිද්ධාන්තය බොහෝවිට භාවිතා කරයි.

උදාහරණ

ස - - - / ස - - - / ස - - - / ස - - - / පළමුවෙනියා

/ ග - - - / ග - - - / ග - - - / දෙවෙනියා

/ ප - - - / ප - - - / තුන්වෙනියා

ඉහත ස්වර එකවර ගායනා කිරීමෙන් හෝ වාදනය කිරීමෙන් එම ධ්වනියේ ගැඹුරු බවක් උද්දීපනය වේ

වර්තමාන ව්‍යවහාරික සංගීතයේ මෙම harmony සිද්ධාන්තය සෑම ගීතයකම දැකිය හැකිය

පහත සඳහන් ස්වර ප්‍රස්තාරය සලකුණු කර ඇත්තේ harmony ස්වර වේ



## පැවරුම්

- පහත සඳහන් ගීත ස්වර ප්‍රස්තාරයට ගැලපෙන හාර්මනි ස්වර ඛණ්ඩය තෝරන්න

**ස ස ස රි / ග - - - / රි ම ග රි / ස - - -**

1 ග ග ග ම / ප - - - / ම ධ ප ම / ග - - -

2 ම ම ම ප / ධ - - - / ප නි ධ ප / ම - - -

3 රි රි රි ග / ම - - - / ග ප ම ග / රි - - -

- දී ඇති ස්වර ප්‍රස්තාරයට ගැන ගැලපෙන හාර්මනි ස්වර ඛණ්ඩයක් ලියන්න

**ග - ම / ප - ග / ම - ග / රි - -**